අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/02/29/25/03/01-ඉංග්‍රීසි

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2024.07.

නම ..........................................
ලිපිනය ..........................................
..........................................
ජා.හැ.අංකය ..................................

මහත්මයාණෙනි/මහත්මියනි/මෙනෙවියනි,

**<u>දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල පවතින ඉංග්‍රීසි විෂය ගුරු පුරප්පාඩු සඳහා ඩිප්ලෝමාධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1(ඇ) ශ්‍රේණියට බඳවා ගැනීම - 2021(2024)</u>**

ඉහත කරුණ සම්බන්ධයෙන් 2021.03.15 දින පළ කරන ලද පුවත්පත් නිවේදනය අනුව 2021.12.12 දින විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වන ලද ලිඛිත පරීක්ෂණයේ හා 2024.05.10, 11, 13 හා 20 යන දිනයන්හිදී අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමෙන් අනතුරුව පවත්වන ලද ප්‍රායෝගික පරීක්ෂණයේ ලකුණු වල එකතුවේ ප්‍රමුඛතාව අනුව ජාතික පාසල්හි ඉංග්‍රීසි විෂය සඳහා ගුරු පත්වීම් ලබාදීම සඳහා ඔබ තෝරා ගෙන ඇති බව සතුටින් දන්වා සිටිමි.

02. ඒ අනුව ඔබ වෙත පත්වීම් ලිපි ප්‍රදානය කිරීමේ උත්සවය 2024.07.03 වෙන බදාදා දින පෙ.ව.09.00ට අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් අරලියගහ මන්දිරයේදී පැවැත්වීමට නියමිතය. එබැවින් එම උත්සවයට සහභාගීවීම සඳහා ඔබ එදින පෙ.ව.07.00 වන විට ජාතික හැඳුනුම්පත රැගෙන ගංගාරාම විහාරස්ථානය (බේරේවැව) අසල පිහිටි ඇතුළුවීමේ දොරටුවෙන් පමණක් අරලියගහ මන්දිරයේ ප්‍රධාන ශාලාව වෙත ප්‍රවිශ්ඨ විය යුතු වේ. (ජාතික හැඳුනුම්පත හෝ අනන්‍යතාව සහතික කළ හැකි ලේඛනයක් රැගෙන ඒම අනිවාර්ය වේ.)

03. පිරිමි පත්වීම්ලාභීන් කළු කලිසම, සුදු කමිසය සැරසිය යුතු අතර කාන්තා පත්වීම්ලාභීන් සුදු හෝ ක්‍රීම් පැහැයෙන් යුතු සාරියකින් හෝ ඔසරියකින් සැරසී පැමිණිය යුතුය.

05. එදිනට ඔබ වෙත ලබා දෙන අංකය අනිවාර්යයෙන්ම ඇඳුමේ වම් පස ඉහළින් පැළඳිය යුතු අතර පත්වීම් ප්‍රදාන උත්සවයේ කටයුතු අවසන් වනතුරු ශාලාවේ රැඳී සිටිය යුතු බවද කාරුණිකව දන්වා සිටිමි.

06. මෙම උත්සවය සඳහා පත්වීම්ලාභීන් පමණක් සහභාගී විය යුතු අතර වෙනත් කිසිදු පුද්ගලයෙකු උත්සව ශාලාව වෙත රැගෙන යාමට අවසර දෙනු නොලැබේ.

07. මේ සඳහා ගමන් වියදම් හෝ වෙනත් දීමනා කිසිවක් ගෙවනු නොලැබේ.

මෙයට - විශ්වාසී,

ඒ.ජේ.එස්.එස්.එදිරිසූරිය
අතිරේක ලේකම් ( ආයතන)
අධ්‍යාපන ලේකම් වෙනුවට